(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 159.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2011 දෙසැම්බර් මස 21 වැනි බදාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0562/’10

1.

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ පළමු අදියරේ කොන්ත්‍රාත්කරුවන්ගේ නම් කවරේද;

(ii) එකී කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබුවේ ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමෙන්ද;

(iii) එසේ නම්, එම ටෙන්ඩර්කරුවන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කරන දිනය සහ අවසන් කරන දිනය කවරේද;

(ii) ඒ සඳහා මුදල් සම්පාදනය කරන්නේ කෙසේද;

(iii) පොලිය සහ ඉදිකිරීම් වියදමට අනුව සම්පූර්ණ පිරිවැය කොපමණද;

(iv) ඉදිරි වර්ෂ හය සඳහා වූ මුදල් ප්‍රවාහය පිළිබඳ පුරෝකථනය කවරේද;

(v) ප්‍රාග්ධනය සහ පොලිය සඳහා වන වියදම ද, අනෙකුත් මෙහෙයුම් වියදම් ද, ඉදිරි වර්ෂ දහය තුළ එක් එක් වර්ෂයේ දී ලැබීමට නියමිත ආදායම් ද ඇතුළුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කොළඹ වරායෙන් ලැබෙන ආදායම හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා ලබා ගත් ණය ගෙවීම සඳහා යොදා ගන්නේද;

(ii) ණය මුදල ආපසු ගෙවීම ආරම්භවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1362/’11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ කරඳන සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කොටසක් කඩා ඉවත්කර නැවත අත්තිවාරම් දමා ඇතත්, ඉතිරි ඉදිකිරීම් කටයුතු මේ වන විට නවතා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් ආරම්භ කර ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) ප්‍රතිපාදන වෙන් කර තිබේ නම්, එම මුදල කොපමණද;

(iv) ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භකරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1496/'11

3.

ගරු අජිත් කුමාර මහතා,— තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1557/'11

4.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ මැයි දිනය සැමරීම සඳහා සහභාගි වූ ජනතාව ප්‍රවාහනය කිරිමට රජය විසින් ශ්‍රී ලංගමයේ එක් එක් ඩිපෝවෙන් ලබා ගත් බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ වෙනුවෙන් එක් එක් ඩිපෝවට රජය ගෙවා ඇති මුදල කොපමණද;

(iii) එම බස් රථ සඳහා මුදල් ගෙවා නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2010 මැයි දින සැමරුම සඳහා රජය විසින් ශ්‍රී ලංගමයෙන් ලබා ගත් බස් රථ සඳහා මුදල් මේ වන විට ගෙවා අවසන් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1613/'11

5.

ගරු ඊ. සරවනපවන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කිලිනොච්චිය අධ්‍යාපන කලාපයේ සේවයේ යෙදිය යුතු අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට කිලිනොච්චිය අධ්‍යාපන කලාපයේ සේවයේ නියතු අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එම අධ්‍යාපන කලාපයේ දැනට පවතින අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පියවර ගන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිලිනොච්චිය අධ්‍යාපන කලාපය සඳහා අනුමත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I, II, සහ III ශ්‍රේණිවලට අදාළ විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දැනට සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I, II, සහ III ශ්‍රේණිවලට අදාළ විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අනුමත සේවක සංඛ්‍යාවට අනුව සිටිය යුතු එක් එක් ශ්‍රේණියේ විදුහල්පතිවරු සංඛ්‍යාව එම අධ්‍යාපන කලාපයට ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1804/'11

6.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුලියාපිටිය, කෝන්ගහගෙදර සිට පුගල්ල දක්වා මාර්ගයේ කාපට් ඇතිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම මාර්ගය කාපට් ඇතිරීමේ ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවන් කවරුන්ද;

(iv) එම එක් එක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1909/'11

7\.

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) විදේශ රැකියා සඳහා මැද පෙරදිග රටවලට යන බොහෝ ශ්‍රමිකයන්ට එම රටවල ක්‍රියාත්මක වන ෂරියා නීතිය සහ අනෙකුත් නීති රීති පිළිබඳව දැනුවත්භාවයක් නොමැති බවත්;

(ii) එම හේතුව නිසා විදේශ රැකියාවල යෙදීමේදී ඔවුන්ට විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මැදපෙරදිග රටවල නීති රීති පිළිබඳ නොදැනුවත්කම හේතුවෙන් එම රටවල නීතිය යටතේ වරදකරුවන් වන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්හට නීති ආධාර ලබා ගැනීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි වැඩපිළිවෙළක් හඳුන්වා දී එම ශ්‍රමිකයන්ට ඇතිවන ගැටලු මගහැරවීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එවැනි වැඩපිළිවෙළක් හඳුන්වා දෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 1),— "රාජ්‍ය ආරක්ෂක කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව", "රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව" වශයෙන් නැවත නම් කළ යුතු ය.

2\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 2),— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 13 සහ 14 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

3\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක3),— පාර්ලිමේන්තුව විසින් 2010.07.09 සහ 2011.11.29 දිනයන්හි සම්මත කරන ලද යෝජනාවන්හි කුමක් සඳහන්ව තිබුණද, න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 සිට 19 දක්වා ඇති විෂයයන් පිළිබඳව වැඩ අද දින රැස්වීමේදී ස්ථාවර නියෝග 7, 70(2) සහ 70(3) හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

4\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2012 ජනවාරි මස 17 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

5.

ගරු එම්. බී. ෆාරුක් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2012) — (විසි හතරවැනි වෙන් කළ දිනය) — කාරක සභාව (දෙසැම්බර් 20 වැනි දින ප්‍රගතිය)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 අගෝස්තු 09 දිනැති අංක 1718/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.11.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 ඔක්තෝබර් 13 දිනැති අංක 1727/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.11.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2011 නොවැම්බර් 21 දිනැති අංක 1733/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.14 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සහ 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) සහ 14 වැනි වගන්ති සමග කියවිය යුතු එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 නොවැම්බර් 21 දිනැති අංක 1733/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.14 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 නොවැම්බර් 21 දිනැති අංක 1733/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.14 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමග කියවිය යුතු, 25 වැනි වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 නොවැම්බර් 21 දිනැති අංක 1733/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.17 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 944 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු, (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 (1) වැනි වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2011 නොවැම්බර් 21 දිනැති අංක 1733/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.17 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අංක 945 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 (1) වැනි වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 නොවැම්බර් 21 දිනැති අංක 1733/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.17 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 946 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවනු ලදුව, 2011 ඔක්තෝබර් 19 දිනැති අංක 1728/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.17 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 (1) වැනි වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ඔක්තෝබර් 19 දිනැති අංක 1728/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.17 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 939, 940, 941 සහ 942 දරන සුරාබදු නිවේදන)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) ව්‍යවස්ථාව සමග කියවිය යුතු (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 (1) වැනි වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2011 ඔක්තෝබර් 20 දිනැති අංක 1728/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.17 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අංක 943 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් පනවනු ලදුව, 2011 නොවැම්බර් 21 දිනැති අංක 1733/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යටතේ නියෝගය,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ගුවන් තොටුපල සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් පනවනු ලදුව, 2011 නොවැම්බර් 22 දිනැති අංක 1733/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.20 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

15.

ටී. බී. ඒකනායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

16.

කුමාරසිරි හෙට්ටිගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

17.

ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

18.

හඳගල වලගම්බා පුරාණ ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

19.

ශ්‍රී පියරතන ප්‍රජා සංවර්ධන සහ සමාජීය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

රාජ්‍ය ආරක්‍ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

බදු අභියාචන කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*23.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*26.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*27.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*28.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*29.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*30.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*31.

අධිකරණ අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,—2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 සැප්තැම්බර් 26 දිනැති අංක 1725/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, 2011.11.28 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*32.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*33.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*34.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*35.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වන) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

36.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

37.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2012) නැමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.